**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ("මණ්ඩලය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16</u> අයෝජන කලාප 05 ක රු.134,775,645 කට අගය කර තිබුණු ව්‍යාපෘති 08 ක් සම්පූර්ණ කර මණ්ඩලය වෙත භාර දී තිබියදී සහ ඒවා දැනට භාවිත කරමින් පැවතියදී මණ්ඩලය විසින් එම වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණ අතර එම නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත | සීතාවක, මිරිගම ආයෝජන කලාපවල ව්‍යාපෘති 2022 වර්ෂයේදී ප්‍රාග්ධනිත කර තිබුණු අතර වතුපිටිවල කලාපයේ ව්‍යාපෘති තවදුරටත් ප්‍රාග්ධනිත කිරීමට ඇත. මිරිජ්ජවිල කලාපයේ විදුලිය සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරනු ලැබේ. එරාවූර් | සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති කලානුරූපීව හඳුනාගෙන ප්‍රාග්ධනිත කල යුතු බව. |

| | | |
|---|---|---|
| අංක 16 (LKAS 16) 7 ඡේදයට පටහැනිව කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර දේපල, පිරියත සහ උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. එසේම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16හි 43 ඡේදයට පටහැනිව ක්ෂය වටිනාකම රු. 4,990,565 කින් අඩුවෙන් සහ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට නියමිතය. | |

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තවමත් විභාග වෙමින් පවතින නීතිමය කටයුත්තක් මණ්ඩලයට වාසිදායක තත්ත්වයක පැවති නමුත් මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් රු. 102,138,350 ක් වූ වෙනත් ණයගැතියන් සඳහා පූර්ණ හානිකර ගැලපීමක් සිදුකර තිබිණි. | ආයෝජන මණ්ඩලයට එරෙහිව ප්‍රකාශ කරන ලද විනිශ්චය සභා නඩු තීන්දුව (arbitral award) බලාත්මක කිරීම සඳහා වාණිජ්‍ය මහා අධිකරණය විසින් ආයෝජන මණ්ඩලයේ ගිණුමෙන් තහනම් කල රු.102,138,350 ක මුදලක් ආයෝජන මණ්ඩලය වෙත නිදහස් කර ගැනීම අපේක්ෂාවෙන් ආයෝජන මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩු අංක CA/RI/08/2016 තවමත් විභාග වේ. එම නිසා, තවමත් විභාග වෙමින් පවතින නඩු කටයුත්තෙහි තීන්දුව මත ණය අවදානම අධික බැවින් සියයට සියයක වෙන්කිරීමක් සිදු කර ඇත. | නඩුව මණ්ඩලයට වාසිදායක තත්ත්වයක පවතින බව තහවුරුව ඇති බැවින් හානිකරණය සඳහා අගය ගණනය කිරීමේදී ඒ පිළිබඳ සලකා බැලිය යුතු බව. |
| (ආ) | වසා දැමුණු/මණ්ඩලය සමග ඒවායේ ගිවිසුම් අවලංගු කර තිබුණු ආයතන 06කට අදාල ඉඩම් වාරිකවල විලම්භිත ආදායම වූ රු. 185,178,544 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් සංශෝධනය කිරීමකින් තොරව මණ්ඩලය විසින් ගිණුම්වල දක්වා තිබුණි. | 2021.06.11 දින එක් ආයතනයක ගිවිසුම අවලංගු කර තිබුණු අතර 2022 වර්ෂයේදී එය ගලපනු ඇත. විවිධ හේතූන් මත සියලු ආයතන අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත. එම නිසා 2022 වර්ෂයේදී ගැලපීම් කරනු ලැබේ. | ඉඩම් වාරිකවල විලම්භිත ආදායම මනා සැලකිල්ලකින් යුතුව සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු බව. |
| (ඇ) | හොරණ අපනයන සැකසුම් කලාපයේ පරිපාලන ගොඩනැගිල්ලට අදාලව ක්ෂය සහ සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.543,096 සහ රු.2,926,681 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | වත්කම් නිවැරදිව ක්ෂය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2012-2018 කාල පරිච්ඡේදය තුල නිවාස ව්‍යාපෘති පවරාදීම සඳහා වූ ආදායම් එකතු කිරීමට අදාල ව රු.3,464,665 ක මුදලක් කලින් ලැබීම් ගිණුමට බැර කර තිබුණු අතර පෙර වර්ෂ වලට අදාළ ගැලපුමක් ලෙස නොසලකා එය 2021 වර්ෂයේ විවිධ ආදායම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අතිරික්ත ගෙවීම් ලෙස හඳුනා ගෙන තිබුණු මෙම අගයන් 2021 වර්ෂයේ ආදායම් ගිණුමට මාරු කර ඇත. මෙම අගය, ආදායමක් ලෙස ගිණුම් ගත කළ හැකි බව 2021 වර්ෂයේදී හඳුනාගෙන තිබෙන බැවින් පෙර වර්ෂයට අදාළ ආදායමක් නොවේ. | ආදායම වර්ෂයට අදාළව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු බව. |
| (ඉ) | 2015-2019 වර්ෂයන් තුළ බිම් කුලී, ඉඩම් වාරික සහ වාර්ෂික ගාස්තුවලට අදාලව කලින් ලබීම් ගිණුමට බැර කර තිබුණු රු. 3,782,236 ක මුදලක් පෙර වර්ෂ වලට අදාළ ගැලපුමක් ලෙස නොසලකා 2021 වර්ෂයේ විවිධ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | පෙර වර්ෂ කිහිපයක් තුළ විවිධ ආයතන විසින් සිදු කළ මෙම අතිරික්ත ගෙවීම් 2021 වර්ෂයේදී හඳුනා ගත් බැවින් එම වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගත කර ඇත. | ආදායම වර්ෂයට අදාළව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු බව. |
| (ඊ) | 2011 වර්ෂයේදී වසා දැමුණු සමාගමකට අදාල රු. 2,855,264 ක ආපසු ගෙවිය යුතු තැන්පතුවක්, පෙර වර්ෂ වලට අදාළ ගැලපුමක් ලෙස නොසලකා සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ගෙන තිබුණි. | ආපසු ගෙවීමකින් තොරව රඳවා ගෙන තිබුණු බැවින් සහ 2011 වර්ෂයේදී ගිවිසුම අවසන් කල බැවින් ආයතනයක් 2003 වර්ෂයේදී ගෙවූ රු.2,855,264 ක ආපසු ගෙවිය යුතු තැන්පතුව, 2021 වර්ෂයේදී ආදායමට බැර කර ඇත. | ආදායම වර්ෂයට අදාළව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු බව |
| (උ) | එක් ආයතනයක ඉඩමක් වෙනුවෙන් 2007 නොවැම්බර් මාසයේදී ලැබුණු රු.2,580,365ක මුදලක්, එම අවස්ථාවේදී වන්දි වෙනුවෙන් වූ තැන්පතු ගිණුමට බැර කර තිබුණු අතර මෙම මුදල, පෙර වර්ෂ ගැලපුමක් ලෙස නොසලකා 2021 වර්ෂයේ විවිධ ආදායම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | ආදායම වර්ෂයට අදාළව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු බව |
| (ඌ) | නිදහස් ප්‍රදානයක් ලෙස 2018.03.29 දින රජයෙන් මණ්ඩලය වෙත පවරා දෙනු ලැබූ අක්කර 3.96 ක ප්‍රමාණයෙන් යුත් ඉඩම 2021 දෙසැම්බර් 31 දිනට තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | 2018.03.29 දින නිදහස් ප්‍රදානයක් ලෙස අක්කර 3.96 ක ප්‍රමාණයෙන් යුත් ඉඩමේ අයිතිය පවරා දී ඇත. ආයෝජකයාට ඉඩම බදු දීමේ පරමාර්ථය සඳහා රජයේ තක්සේරුව ලබා ගෙන ඇත. කෙසේ නමුත්, එම තක්සේරුව සමග සංවර්ධනය නොකළ ඉඩමේ වටිනාකම ඉදිරිපත් කර නොමැත. | වත්කම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2017 වර්ෂයේ දෙසැම්බර් ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබුණද කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ තුල ඇතුළත් රු.516,964,285 කට අගය කරනු ලැබූ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ මාර්ග, දේපල පිරියත හා උපකරණ තුල ඇතුළත් ව්‍යුහයන් යටතට මාරු කර නොතිබුණි. එම නිසා, 2017 සිට එක් එක් වර්ෂය සඳහා ක්ෂය වියදම රු. 25,848,214 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු ඉතිරි මුදල වූ රු.130,383,717 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම් ගත කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුවේ මතභේදකාරි තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ අවසන් ගෙවීම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා නොතිබුණි. මෙම කරුණ මීට පෙර සමාලෝචනය කර ඇති අතර මතභේදකාරි තත්ත්වය විසඳුනු පසුව පමණක් මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනිත කළ හැකිය. මෙය තවදුරටත් 2022 මුල්‍ය වර්ෂයේදී විස්තරාත්මකව සමාලෝචනය කරනු ඇත. | කොන්ත්‍රාත්තුවේ මතභේදකාරි තත්ත්වය වහාම නිරාකරණය කර ගිණුම් ගත කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

--------------------

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | 2018දී ගිවිසුම් අත්සන් කර තිබුණු සමාගමක් ආරම්භයේ සිට රු.97,788,426 ක් වූ එහි බිම් කුළිය ගෙවීම පැහැර හැර තිබුණි. සමාගමෙන් හිඟ මුදල් අය කර ගැනීමට කිසිදු උත්සහයක් ගැනීමකින් තොරව, ඉහත ශේෂයට එරෙහිව මණ්ඩලය මූල්‍ය ප්‍රකාශනවල සියයට 100 ක හානිකරණ ගැලපීමක් සිදු කර තිබුණි. | ආයෝජන මණ්ඩලය ගිවිසුමට අනුව එහි වගකීම් ඉටු කිරීමට තවමත් අපොහොසත් වීම අභියෝගයට ලක් කරමින් සමාගම බිම් කුලිය ගෙවීම පැහැර හැර තිබුණු අතර පූර්ව කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සමාගම බිම් කුලියේ හිඟ මුදල් ගෙවීම සිදු කරනු ඇත .<br>එම නිසා, අධික ණය අවදානම සැළකිල්ලට ගනිමින් ආයෝජන මණ්ඩලය හානිකරණය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට සියයට 100ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. | බිම් කුලිය අය කර ගැනීම සඳහා පියවර ගත යුතු බව. |
| (ආ) | 2021 දෙසැම්බර් වන විට මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනවලින් ලැබිය යුතු මුදල් රු.737,308,534 ක් වූ අතර ඉන් එකතුව රු. 170,396,676 ක මුදලක් එනම් සියයට 23 ක් වර්ෂ 04කට වඩා වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි. 2021 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල් මත හානිකරණය සඳහා වෙන්කිරීම රු.418,846,474 ක් වූ අතර එය | ආපසු අයකර ගනු ලබන අගය ඉක්මවා වත්කමක පොත් අගය හෝ එහි මුදල් උපයන උපාංග පවතින අවස්ථාවකදී හානිකරණ අලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරණ අලාභ, ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | මුළු හිඟ මුදලින් සියයට 57 ක්ව පැවතුණි. | | |
| (ඇ) | වටිනාකම රු. 776,797,006 ක් වූ සේවක ණය හා අත්තිකාරම් තුළ පැවති 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,222,035 ක් වූ ශේෂය සේවය තහනම් කළ, සේවය අත්හැර ගිය, ගෙවීම නතර කළ නිලධාරීන් 25 දෙනෙකුගෙන් වර්ෂ 04කට වඩා වැඩි කාලයක සිට ලැබිය යුතුව තිබුණි. | ඒ අනුව, අදාල විමසුමේ පෙන්වා දී ඇති සිද්ධීන්ට අදාලව නැවත අය කර ගැනීම පිලිබඳ පියවර දැනටමත් ගෙන වර්තමානයේදී කෙරීගෙන යමින් පවතී. | සේවක ණය හා අත්තිකාරම් අය කර ගැනීම සඳහා පියවර ගත යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------ | ------------------ | ------------------------------- | ------------- |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** ------------------ | රු. | | |
| | i. මුදල් රෙගුලාසි 103,104 සහ 1642 | 2021 වර්ෂයේදී සිදුවූ වාහන අනතුරු 15 ක් සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම සහ මූලික පරීක්ෂණ පැවැත්වීම සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි තුලින් පනවා ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් වූ ක්‍රියාපරිපාටියට ආයෝජන මණ්ඩලය විසින් අනාගතයේදී සම්පූර්ණයෙන්ම අනුගත වනු ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු බව. |
| | ii. මුදල් රෙගුලාසි 110 | අලාභ හා හානි සඳහා ලේඛණයක් විධිමත්ව පවත්වා ගෙන නොතිබුණි. | විස්තරාත්මක වාර්තාවක් පවත්වා ගනු ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව ලේඛනයක් පවත්වා ගත යුතු බව |
| (ආ) | **රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ** ----------------- | | | |
| | i. 1994 ජුනි 14 දිනැති අංක 95 චක්‍රලේඛ | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු. 666,716,143 ක දීමනා වර්ග 10 ක් සහ රු.420,800,245 ක ණය හා සුභ සාධන | 2020.07.24 දිනැති ලිපිය මගින් කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මෙම කරුණ අප යොමු කර තිබුණු අතර ආයෝජන මණ්ඩලයේ සේවකයන් සඳහා ගෙවන දීමනා වෙනුවෙන් අනුමැතිය | අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | යෝජනාක්‍රම 13ක් ස්ථාපිත කර තිබුණි. | ඉල්ලා තිබුණත් ඔවුන්ගේ තීරණය තවමත් ලැබී නොමැත. | |
| ii. | 2015 මැයි 25 දිනැති අංක පීඒඩී/2015 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය, 2016 ඔක්තෝබර් 26 දිනැති අංක පීඒඩී/2015 (i) දරන චක්‍රලේඛය සහ 2020 ජනවාරි 27 දිනැති පීඒඩී 01/2020 අංක දරන චක්‍රලේඛය | • චක්‍රලේඛයට පටහැනිව පහත ආකාරයට ඉන්ධන සීමාවන් වෙනස් කර තිබුණි.<br>සභාපති - අවශ්‍ය පරිදි<br>අධ්‍යක්ෂ ජනරාල් - ලීටර් 300<br>විධායක අධ්‍යක්ෂ - ලීටර් 170<br>අධ්‍යක්ෂ - ලීටර් 140 | දක්වා ඇති කරුණු නිවැරදිය. අධ්‍යක්ෂ මණ්ඩලය ආයෝජන මණ්ඩලයේ උසස් නිලධාරීන්ගේ අධික ප්‍රවාහන අවශ්‍යතා (කලාපවලට යාම, රැස්වීම්, වැඩබිම් පරීක්ෂාවන්, සම්මන්ත්‍රණ ආදිය) තීරණාත්මකව විශ්ලේෂණය කරමින් උසස් නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාවන් තීරණය කර තිබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතු බව. |
| | | • චක්‍රලේඛයට පටහැනිව නිල වාහනයක් සඳහා හිමිකමක් ඇති නිලධාරීන් 33 දෙනෙක් සඳහා මාසිකව රු. 35 000 බැගින් එකතුව රු.11,134,215 ක් වූ රියදුරු දීමනා ගෙවා තිබුණි. | 2003 වර්ෂයේදී, අයෝජන මණ්ඩලයේ රියදුරෙකු වෙනුවට කුලියට ගත් රියදුරෙකු සඳහා රු.15,000ක මාසික දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.<br>වසර 15 ක සිට මෙම ගෙවීම එකම අගයක පැවතීම හේතුවෙන් 2020 වර්ෂයේදී අගය වැඩිකිරීමට මණ්ඩලය තීරණය කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතු බව. |
| iii. | 2003 ජුනි 02 දිනැති අංක පීඒඩී/12 දරන චක්‍රලේඛය<br>• 9.3.1 ඡේදය | බඳවා ගැනීමේ පරිපාටියේ නියමයන් නොසලකා සමාලෝචිත වර්ෂය තුල “විශේෂ ඒකකය” පිහිටුවීම සඳහා නිලධාරීන් 09 දෙනෙකු පත් කර තිබුණු අතර ඔවුන්ගේ වැටුප සම්බන්ධයෙන් “වැටුප සාකච්ඡා කල හැක” යනුවෙන් පුවත්පත් දැන්වීම පළ කර තිබුණි. | ආයෝජන මණ්ඩලය තුල විශේෂ ඒකකයක් පිහිටුවීමේ මූලික පරමාර්ථය, ඉහල නිපුණත්වයක් ඇති වෘත්තියවේදීන් ආකර්ශණය කර ගැනීම සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ බඳවා ගැනීමේ පරිචයන් සමග අනුගත වීමත් නිසා විශේෂ ඒකකය සඳහා කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම සඳහා පළ කළ වෙළඳ දැන්වීම මගින් ගෙවනු ලබන | බඳවා ගැනීමේ පටිපාටිය තුල ඇති කොන්දේසිවලට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පාරිශ්‍රමිකය සාකච්ඡා කල හැකි බව සහ වෙළඳ රේටයන් සමග සැසඳිය හැකි බවත් එලෙසම රාජ්‍ය අංශයට වඩා වැඩි වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ පැකේජයක් මෙම තනතුරු වල පත්වීම්ලාභියා සදහා පිරිනමන බවත් දක්වා ඇත. | |
| | • 9.3.1 (viii) ඡේදය | මණ්ඩලයේ අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සදහා අනුප්‍රාප්තික සැලැස්මක් ආයෝජන මණ්ඩලය විසින් පවත්වා ගන්නා බව විගණනයට අනාවරණය නොවුණි. | වෘත්තීමය ආයතනයක් විසින් හෝ අත්දැකීම් සහ කිසියම් ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති තනි පුද්ගලයෙකු විසින් අනුප්‍රාප්තික සැලැස්ම සැකසිය යුතු බව කලමනාකරණයේ දැක්ම වේ. ඒ අනුව, අනුප්‍රාප්තික සැලැස්මක් සැකසීමේ ක්‍රියාවලිය කෙරෙමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතු බව. |
| (ඇ) | කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ<br>---------------- | | | |
| | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛයේ 14.1 ඡේදය | ගෙවීම සදහා හිමිකමක් නොමැති තෘතීයික මට්ටමේ තනතුරු 21 ක නිලධාරීන් 242කට රු.10,704,620 ක් වූ මුදලක් විශේෂ දිමනාවක් ලෙස ගෙවා තිබුණි. | 1978 වර්ෂයේදී විධායක සහකාර තනතුරේ සිට මණ්ඩලයේ විධායක කාණ්ඩය ආරම්භ වී ඇති අතර ඔවුන් විධායක නිලධාරීන්ට අයත් සියලු අයිතිවාසිකම්වලට හිමිකම ලබන අතර මණ්ඩලයේ විධායක සහකාරවරු ලෙස හඳුනා ගෙන ඇත. කෙසේ නමුත්, 2006 කලමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 සහ 30(1) යටතේ වැටුප් ප්‍රතිව්‍යුහගතකරණයේදී ඉහත කී විධායක සහකාරවරුන්, මණ්ඩලයේ විධායක සේවයේ ඔවුන්ගේ වෘත්තිමය කාලය මෙන්ම වසර 25 ක කාල පරිච්ඡේදයක් පුරාවට මණ්ඩලය විසින් පවත්වා ගෙන තිබුණු ක්‍රමවේදය නොසලකා කණිෂ්ඨ කලමනාකරු යටතේ | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කල යුතු බව. |

| | | |
|---|---|---|
| | | පිහිටවනු ලැබිණි. ඉහත කලමනාකරණ චක්‍රලේඛ නිකුත් කිරීමේදී අදාල ගෙවීම වසර දෙකක කාලයක් සඳහා ගෙවමින් තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,363,405,054 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 886,892,760 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 476,512,294 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මෙම වර්ධනයට ආදායම සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.659,882,294 සහ රු. 8,186,971 කින් වැඩිවීම හා ඊට ප්‍රතිරූපීව මුළු මෙහෙයුම් වියදම් රු.197,316,297 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෙරී ගෙන යන එක් එක් මුළු ප්‍රාග්ධන වැඩ තුල සියයට 63.6 හා සියයට 91 ක් ලෙස දක්වා තිබුණු පිලිවෙලින් රු.568,142,375 ක් සහ රු.224,192,401 ක් වූ සාමාන්‍ය ව්‍යාපෘති සහ විශේෂ ව්‍යාපෘති, සම්පූර්ණ කිරීම සඳහා පියවර ගැනීමකින් තොරව වසර 04කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. | ව්‍යාපෘති දෙකක් සඳහා හැර ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ අගයන් ගැලපීමට සුදුසු පියවර ගැනීම සඳහා ඉතිරි ශේෂයන් විස්තරාත්මකව සමාලෝචනය කරනු ඇත. | නියමිත කාලයට ව්‍යාපෘති සම්පූර්ණ කර ප්‍රාග්ධනිත කළ යුතු බව. |
| (ආ) | මණ්ඩලය විසින් ප්‍රධාන කාර්යාලයේ මහල් 02 ක් අමාත්‍යාංශ 03 ක් වෙත සහ කලාප ගොඩනැගිලි, බාහිර පාර්ශවයන් වෙතද කුලියට ලබා දී තිබුණි. පහත නිරීක්ෂණයක් කෙරේ. | | |
| | i. රාජ්‍ය අමාත්‍යාංශයක් ඇතුලුව බාහිර පාර්ශවයන් 40 දෙනෙකු විසින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ කලාප පරිශ්‍ර තුල වර්ග අඩි 43,931.59 ක ප්‍රමාණයක් රු.16,446,233 ක මාසික කුලියකට භාවිතා කර තිබුණද ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | බතික්, අත් යන්ත්‍ර රෙදිපිළි හා දේශීය නිමි ඇඳුම් නිෂ්පාදන අමාත්‍යාංශය වර්ග අඩි 3800 ක බිම් ප්‍රමාණයක් භාවිත කරන අතර බඳු ගිවිසුමක් අත්සන් කර නොතිබුණද විධිමත්ව මාසික කුලිය ගෙවා ඇත.<br>බාහිර පාර්ශව වෙත කුලියට ලබා දී ඇති කලාප ගොඩනැගිලිවල තත්ත්වය ඉදිරිපත් කර ඇත. | ගිවිසුම්වලට එළඹිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| ii. | අමාත්‍යාංශ දෙකක් සඳහා නියමිත කාලයට ඉන්වොයිසි යැවීමට අපොහොසත් වීම හේතුවෙන් මුළු එකතුව රු.13,466,838 ක් වූ කුලියක් එකතු කර ගැනීමට නොහැකිව තිබුණු අතර 2020 අගෝස්තු සිට එකතුව රු.4,934,018 ක් මුදලක් රාජ්‍ය අමාත්‍යාංශයකින් අයකර ගත නොහැකි වී තිබුණි. | ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කරන ලෙස අමාත්‍යාංශ වෙත දන්වා ඇත.<br>ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2022 මාර්තු වෙන තෙක් කුලිය ගෙවා ඇත.<br>වර්තමානයේදී, 2021 වර්ෂය වෙනුවෙන් සංචාරක අමාත්‍යාංශයෙන් රු. 1,000,000 ක මුදලක් පමණක් ලැබිය යුතුව ඇත. | නියමිත කාලයට ඉන්වොයිසි නිකුත් කළ යුතු බව. |
| (ඇ) | කාර්මික තාක්ෂණ ආයතනය සමග පාරිසරික බලපෑම් අධ්‍යයන වාර්තාව සැකසීම සඳහා ගිවිසුම අනුව එකඟ වූ මුදල රු. 4,180,000 ක් වුවද බිංගිරිය කරබන් ඔය හරහා පිරිපහදු කල අප ජලය මුදාහැරීම ප්‍රායෝගිකව සිදු කිරීමට නොහැකිවීම හේතුවෙන් අධ්‍යයන කටයුතුවල විෂය පථය පුළුල් කරමින් නව ව්‍යාපෘතියක් හඳුන්වා දීමට සිදුව තිබුණු අතර මණ්ඩලයට රු.1,652,500 ක අතිරේක මුදලක් ඒ සඳහා වැය කිරීමට සිදුව තිබුණි. | නිර්ජල ආශ්‍රිත කර්මාන්ත (කාර්මික අපජලය ජනනයක් නොමැත) සඳහා පමණක් ඉඩ සලසා දීම සහ අවශ්‍ය පිලියම් කිරීමෙන් පසුව කරබන් ඔයට බැහැර කිරීම තුලින් මල අපවහනය හා ගෘහස්ත අපජලය කලමනාකරණය කිරීම මූලික යෝජනාව විය. කෙසේ නමුත් හේතු දෙකක් නිසා ජලය, අපජලය, අනතුරුදායක අපද්‍රව්‍ය හා වාතය විමෝචනය යන ක්ෂේත්‍රවල අමතර අධ්‍යයනයන් අවශ්‍ය වේ. ශබ්දය/කම්පන මට්ටම් සම්බන්ධයෙන් ද අතිරේක කටයුතු සිදුකර ඇත. | අතිරික්ත වියදෙමහි වෙනස්වීම සියයට 47ක් වන අතර එම නිසා ඇස්තමේන්තු හැකි සෑම විටම නිවැරදිව සකස් කළ යුතු බව. |
| (ඈ) | වසර තුනකට වැඩි කාලයක සිට ගෙවිය යුතු රු. 1,144,695 ක මුදලක් සැපයුම්කරුවන් 7 දෙනෙකුගෙන් තොරතුරු එකතු කිරීමකින් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2021 වසර තුල විවිධ ආදායම්වලට බැර කර තිබුණි. | විගණන කමිටුවේ නියමය පරිදි, වසර තුනකට වැඩි හිමිකම ඉල්ලා සිටීමක් නොමැතිව එලෙසම පැවති ශේෂයන් සමාලෝචනය කර හිමිකම් ඉල්ලා නොමැති අගයන් 2021 වර්ෂයේදී ආදායම් ගිණුමට මාරු කර ඇත. | ගෙවීම සඳහා උත්සාහ දැරූ බවට සහතික වීම සඳහා සාක්ෂි තිබිය යුතු අතර එවැනි ගණුදෙණු සඳහා පූර්ව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගත යුතු බව. |
| (ඉ) | එක් එක් කලාපවලින් ඉදිරිපත් කර තිබුණු තොරතුරුවලට අනුව ආයෝජනය සඳහා තිබෙන කාර්මික භූමි ප්‍රමාණය, මූල්‍ය අංශය මගින් ඉදිරිපත් කර තිබුණු ආයෝජන දේපල සමග එකඟ නොවුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වෙනස අක්කර 627.5ක් බව නිරීක්ෂණය විය. එම නිසා ඉඩම්වල ප්‍රමාණයන්හි නිරවද්‍යතාවය සහ | සැසඳුමක් ඉදිරිපත් කර ඇත. | සැසඳීම සිදු කළ යුතු බව හා කලාපවල සහ මූල්‍ය අංශයේ සඳහන් ඉඩම් ප්‍රමාණය එකම විය යුතු බව. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | වටිනාකම විගණනයට අනාවරණය නොවුණි. | | |
| (ඊ) | මල්වත්ත කලාපයේ ඉඩම් අක්කර දෙකක ප්‍රමාණයක් හා වර්ග මීටර් 3906 ක ගොඩනැගිල්ල 2012 වර්ෂයේදී සමාගමක් වෙත මුදා හැර තිබුණද, ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම නිසා 2014 සිට රු. මිලියන 24.1 ක් වූ බිම් කුලි, ඉඩම් වාරික, ජලය සහ අපජලය සඳහා අයකිරීම් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ගත වන ලෙස ආයෝජන මණ්ඩලය විසින් ආයෝජකයා දැනුවත් කර තිබුණද එසේ සිදු කර නොතිබුණි. | කරුණු විසඳා ගත යුතු අතර ගිවිසුම්වලට එළඹීම තුළින් ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතු බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර පැවති අමාත්‍යාංශය මගින් මිල්ලනිය අපනයන සැකසුම් කලාපය ආරම්භ කිරීම සඳහා 2017, 2018 සහ 2019 වර්ෂවලදී මණ්ඩලයට රු. මිලියන 1988 ක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ආරම්භ කර නොතිබුණි. | <u>මිල්ලනිය අපනයන සැකසුම් කලාපය</u><br>ඉඩමේ බදු හිමියා විසින් 2019.05.24 දින ඉඩම අත්පත් කර ගැනීම වැලැක්වීම සඳහා අමාත්‍යාංශයට එරෙහිව නඩු පවරා තිබුණු අතර එය තවමත් විසඳී නොමැත. එම නිසා 2019.05.24 දින සිට මිල්ලනිය කලාපය සඳහා ලබා දෙන වැඩ බිම් යටිතල පහසුකම් තාවකාලිකව අත්හිටුවා ඇත.<br><br><u>බිංගිරිය අපනයන සැකසුම් කලාපය</u><br>එක් ආයතනයක් මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යන අතර අනෙක් ආයතන දෙක ඉදිකිරීම් කරගෙන යන අතර කටයුතු හොඳින් සිදු කෙරෙමින් පවතී. | සංයුක්ත සැලැස්මට අනුව සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු බව. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හරහා නිසි කලට ජල සැපයුම ලබා ගැනීම සඳහා පියවර ගෙන නොතිබීම හේතුවෙන් ජල බවුසර මගින් වතුපිටිවල කලාපය වෙත ජල සැපයුම සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.4,384,440 ක මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | වතුපිටිවල කලාපයේ දිනක ජල ඉල්ලුම ඝන මීටර් 1400 ක් පමණ වේ.නව ජල සැපයුම් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කලාපයට ආසන්නව සහතික විය හැකි ජල මූලාශ්‍රයක් නොමැත. | සැලකිය යුතු මුදලක් බවුසර කුලියට ගැනීම වෙනුවෙන් දැරීමට සිදු වන බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීම |

සඳහා විධිවිධාන යෙදිය යුතු බව.

(ඇ) ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කලාප 14කට අයත් ගිවිසුම් අත්සන් කර තිබුණු ආයතන සංඛ්‍යාව 740ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ආයතන සංඛ්‍යාව 440 ක් විය. එම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතන 285 ක් පමණක් ක්‍රියාත්මකව පැවතුණි.

ඉහත දැක්වූ වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ව්‍යාපෘති 440, ආරම්භයේ සිට වර්තමානය දක්වා වර්ෂ 43 ක් (1978-2021) සඳහා වූ පරාසයක පවතින බව සටහන් කල යුතුය. එසේම, මෙම ව්‍යාපෘති 440 ලැයිස්තුවට වෙනත් සමාගමක් සමඟ ඒකාබද්ධ වූ හෝ පවරාගත් ව්‍යාපෘති 86 ක් ඇතුළත් වේ, එනම් ඒවා තාක්ෂණික වශයෙන් ක්‍රියාත්මක වේ. ගිවිසුම් අවලංගු කරනු ලැබූ, වසා දැමුණු හෝ මෙහෙයුම් අත්හිටවූ ඉතිරි ව්‍යාපෘති 354 සඳහා ගිවිසුම්වලට අනුකූල නොවීම, ඇණවුම් නොමැතිවීම, මූල්‍ය අපහසුතා, සමාගම් බංකොලොත්භාවයට පත්වීම යනාදී කරුණු හේතු වී ඇති අතර ඒවායින් බහුතරය ආයෝජන මණ්ඩලයේ පාලන සීමාවෙන් බාහිරව පැවතුණි.

වසා දැමුණු, අත්හිටවූ හෝ ගිවිසුම් අවලංගු කරනු ලැබූ ආයතන සියයට 50 ක් පමණ වන හෙයින් පූර්ව සමාලෝචනය කර එය අවම කර ගැනීමට ප්‍රතිකර්ම පියවර ගත යුතු බව

(ඈ) සමාලෝචිත වර්ෂය හා සැසඳීමේදී පූර්ව වර්ෂ 03 ක සෘජු විදේශ ආයෝජනවල ප්‍රගතිය පහත පරිදි වේ.

| වර්ෂය | සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ඉලක්කය (ඇ.ඩො. මිලියන) | සත්‍ය ඉපයීම (ඇ.ඩො. මිලියන) | සත්‍ය ඉපයීම වාර්ෂික ඉලක්කයෙහි ප්‍රතිශයක් ලෙස (%) |
|---|---|---|---|
| 2021 | 1,100 - 1,300 | 780 | 60 |
| 2020 | 5,000 | 687 | 14 |
| 2019 | 3,000 | 1,189 | 40 |
| 2018 | 2,500 | 2,367 | 95 |

2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කය සියයට 74 කින් අඩු වී තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය ප්‍රගතිය ඇ.ඩොලර් මිලියන 780 ක් පමණක් තිබූ බව නිරීක්ෂණය විය.

2019 (පාස්කු ඉරිදා ප්‍රහාරය) සහ 2020 (කොවිඩ් වසංගතය) වර්ෂ තුල ආයෝජන පරිසරයට සිදු වූ අහිතකර බලපෑම සලකා බලමින් 2020 වර්ෂය සඳහා සාමාන්‍ය තත්ත්වයන් යටතේ ස්ථාපිත ඉලක්කය ජූලි සිට දෙසැම්බර් කාල පරිච්ඡේදය දක්වා සංශෝධනය කර තිබුණු අතර 2020 වර්ෂය සඳහා ස්ථාපිත නව ඉලක්කය ඇ.ඩොලර් 0.9 – 1.1 ත් විය. කොවිඩ් වසංගතයේ අඛණ්ඩ බලපෑම සලකා බලමින් 2021 වර්ෂය සඳහා සෘජු විදේශ ආයෝජන ඉලක්කය ඇ. ඩොලර් මිලියන 1.1 සිට 1.3 ක් ලෙස ස්ථාපිත කර තිබුණි.

මණ්ඩලය සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා උපක්‍රම ස්ථාපිත කර ඉලක්ක සපුරා ගත යුතු බව.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1983 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයේ කලාප 14 කට අයත් මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 4045 ක් වූ අතර ඉන් අක්කර 721.5 ක ඉඩම් ප්‍රයෝජනයට නොගෙන හිස්ව පැවතුණි. | ප්‍රතිලාභ මත පදනම් ව, උපරිම ආයෝජන ප්‍රමාණයක් සහිත සහ අපනයනය අරමුණු කර ගත් විභව ආයෝජකයන් ආකර්ශනය කර ගැනීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස ආයෝජන මණ්ඩලයේ කලාප ඉඩම් ආයෝජන කටයුතු සඳහා භාවිතා කිරීම වෙනුවෙන් හිස් ඉඩම් ආයෝජකයන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය අඛණ්ඩව පියවර ගනිමින් ඇත. | හිස් ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිතා කළ යුතු බව. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය (Integrated Accounting Software System) ස්ථාපනය කිරීම 2019 අප්‍රේල් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණද මේ දක්වා එය සම්පූර්ණ කර නොතිබුණු අතර ඒ සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු.3,750,000 ක අතිරේක වියදමක් දරා තිබුණි. | මුල් ව්‍යාපෘති ක්‍රියාත්මක සැලැස්මට අනුව මාස 09 ක කාල පරිච්ඡේදයක් තුල ERP පද්ධතිය ස්ථාපිත කිරීම සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද ආයෝජන මණ්ඩලය අපේක්ෂිත ERP පද්ධතියේ පැවති සංකීර්ණභාවය සහ 2020 හා 2021 කොවිඩ්-19 වසංගතයේ පැතිරීමෙන් ඇති වූ බලපෑම හේතුවෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ අරමුණු සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. | නියමිත කාලය තුළ ව්‍යාපෘතිය සාර්ථකව නිම කළ යුතු බව. |
| (ආ) | ඉදිකිරීම් කාලය මාස 4 ක් ලෙස දක්වමින් බිංගිරිය කලාපයේ බටහිර මායිමට අදාළ ආරක්ෂිත වැට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව රු.32,087,075 ක පිරිවැයකට 2019 අප්‍රේල් 29 දින පිරිනමා තිබුණි. රු.31,814,285 ක මුදලක් වැය කර තිබුණු සහ මාස 20 ක ප්‍රමාදයක සහිතව මණ්ඩලය වෙත ව්‍යාපෘතිය භාර දී තිබුණද භෞතික පරීක්ෂාවේදී සමහර ප්‍රදේශවල වැට ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබුණු අතර නිසි පරිදි නඩත්තු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2019 වර්ෂයේදී නැගෙනහිර මායිමට අදාළ ආරක්ෂිත වැටෙහි ඉදිකිරීම් | කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය තවමත් කෙරෙමින් පවතී. කුඹුරු ඉඩම් සහ පොදු මාර්ග හැරවුම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සම්පූර්ණ කරන තෙක් වැටෙහි ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. තවමත් කෙරෙමින් පවතින කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ කරුණු හේතුවෙන් නැගෙනහිර මායිමේ ආරක්ෂිත වැටෙහි ඉදිකිරීම් මේ දක්වා ආරම්භ කළ නොහැකි වී ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය මගින් විකල්ප මාර්ගවල වැඩ කටයුතු අවසන් කරන තෙක් බිංගිරිය කලාපයේ I අදියර හරහා මුල සිටම පිහිටා ඇති පොදු මාර්ගය වසා දැමිය නොහැක. | සැලසුම් කල පරිදි වියදම් කළ මුදලට සරිලන පරිදි කාර්යසාධනය ඉටු කර ගැනීමට ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සැලසුම් කර තිබුණද ප්‍රසම්පාදන ක්‍රියාවලිය හෝ ආරම්භ කර නොතිබුණු අතර එම නිසා ව්‍යාපෘතියේ අරමුණ වන භූමියේ ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ අනුමත කළ කාර්ය මණ්ඩලය 1299 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 1253 ක් විය. පුරප්පාඩු 128 ක් සහ කොන්ත්‍රාත් පදනම මත වූ තනතුරු 07 ක් ඇතුළුව අතිරික්ත කාර්ය මණ්ඩලය 128 ක් විය. කෙසේ නමුත්, විශේෂ කණ්ඩායමක් ලෙස බඳවා ගත් නිළධාරීන් 09 දෙනෙකු සත්‍ය කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මුළු කාර්ය මණ්ඩල පිරිවැය රු. මිලියන 2091.8 ක් වූ අතර ඒය මුළු පිරිවැයෙන් සියයට 62 ක් නිරූපණය කරනු ලබයි. | 2022 වර්ෂයේ මුල් මාස 04 තුල පුරප්පාඩු 67 ක් පිරවීම සඳහා විධිවිධාන ගෙන ඇත. කෙසේ නමුත්, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කල 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස්වලට අනුව සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා තිබුණි. 2019.09.18 දිනැති අංක 29/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව 2019.09.01 දින ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර තිබුණු අනියම්/කොන්ත්‍රාත් පදනම මත වූ සේවකයන් කළමනාකරණ සහායක සහ ප්‍රාථමික මට්ටමේ සියලු අතිරික්ත සේවකයින් විය. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ආ) | ඉතා වැදගත් නියාමන ආයතනවල සහ රාජ්‍ය ආයතනවල (Key Regulators and State Enterprises) ශක්‍යතාවන් වර්ධනය කර ගැනීම වෙනුවෙන් මණ්ඩලයට වෘත්තීයවේදීන් 29 දෙනෙක් බඳවා ගැනීමට 2021.03.25 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පරිපාටියට සහ කාර්ය මණ්ඩල තනතුරු සීමාවට පටහැනිව හා පවතින වැටුප් පරිමාණ සහ එක් එක් තනතුරෙන් ලබා ගන්නා විශේෂිත ප්‍රතිඵලය (outcome) හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුලදී වර්ෂ 03 ක කොන්ත්‍රාත් පදනම මත වෘත්තීයවේදීන් 09 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | කැබිනට් මණ්ඩලය විසින් අනුමත කල වැටුප් පරිමාණවලට සහ වෙලඳපල අගයන්ට අනුකූල වූ ඒම වැටුප් පරිමාණවලට විශේෂීකරණය වූ 29 ක කාර්ය මණ්ඩලයකින් යුත් කණ්ඩායමකින් සමන්විත නව ඒකකයක් පිහිටුවමින් ආයෝජන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා 2021.03.23 දිනැති කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිය අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 වාර්ෂික වාර්තාව

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වීමෙන් දින 150කට පසුව විගණන වාර්තාව සමග විගණනය කරන ලද අවසන් ගිණුම් භාෂා තුනෙන්ම පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු නමුත් 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2022 මැයි 20 දින වන විටත් පාර්ලිමේන්තු සභාගත කර නොතිබුණි. | වාර්ෂික වාර්තාවේ සිංහල හා දෙමළ පරිවර්තන 2021 ජූලි 29 දින විගණකාධිපති වාර්තාව ලැබීමෙන් පසුව සිදු කර තිබුණු අතර ආයෝජන මණ්ඩලයේ කළමනාකරණය වෙනස් වීම වාර්තාව අවසන් කිරීමේ කටයුතු ප්‍රමාද වීමට හේතු විය.<br>2020 වාර්ෂික වාර්තාව නව රේඛිය අමාත්‍යාංශය (මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය) හරහා කැබිනට් අනුමැතියට යොමු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව පියවර ගත යුතු බව. |

### 4.2 සංයුක්ත සැලැස්ම

-------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මෙහි පිටපත් සමග යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය විගණකාධිපතිවරයා වෙත සෑම මුදල් වර්ෂයක් ආරම්භයට අවම වශයෙන් දින 15 කට පෙර ලබා දියයුතු වුවත් 2021 මුදල් වර්ෂය ආරම්භවීමෙන් මාස 07ක් පමණ ප්‍රමාදයකින් පසුව මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | 2020-2021 කාල පරිච්ඡේදය තුල කළමනාකරණය තුල සිදුවූ වෙනස්කම් සහ කලින් කලට සැලසුම් කර ක්‍රියාත්මක කළ ව්‍යුහගත වෙනස්කම් හේතුවෙන් 2021 ජුනි 01 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා තෙක් 2021 සංයුක්ත සැලැස්ම අවසන් කිරීම ප්‍රමාද විය. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගත හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු බව. |
| (ආ) | PED /12 චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක්, වසර තුනකට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා බලාත්මක යාවත්කාලීන සැලැස්මක් විය යුතු වුවත් මණ්ඩලය 2021 වර්ෂය සඳහා පමණක් සංයුක්ත | 2020 දී සහ 2021 දීත් අඛණ්ඩව පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ආයෝජන මණ්ඩලය සඳහා දිගුකාලීන ඉලක්ක ස්ථාපිත කිරීමේ අපහසුතාවයක් ඇතිවීම හේතුවෙන් ගෝලීය සහ දේශීය ආයෝජන වාතාවරණයේ වෙනස්වීම් | මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගත හැකි ආකාරයෙන් චක්‍රලේඛ විධිවිධානවලට |

| | | |
|---|---|---|
| සැලැස්මක් පිළියෙළ කර තිබුණි. තවද, සංයුක්ත සැලැස්මක ඉතා වැදගත් අංග වන ආයතනය සතු වර්තමාන සම්පත්, සංවිධාන ව්‍යුහය, SWOT විශ්ලේෂණය සහ අනුරූප වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵලවල සමාලෝචනයක් 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි ඇතුලත් කර නොතිබුණි. | අනුමාන කිරීමට නොහැකිවී ඇත. එම නිසා, අන්තර්කාලීන මිනුමක් ලෙස සංයුක්ත සැලැස්ම 2021 වර්ෂය සඳහා පමණක් සීමා කර ඇත. | අනුකූල වියයුතු බව. |

**4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2021 වර්ෂය ආරම්භයේ සිට මාස 09 ක ප්‍රමාදයකින් පසුව පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත යොමු කර තිබුණු අතර එය 2021 වර්ෂය සඳහා පිළියෙල කල සංයුක්ත සැලැස්ම සමග අනුකූල නොවුණි. | ආයෝජන මණ්ඩලයේ පෙර පැවති කළමනාකරණය විසින් කලින් කලට සැලසුම් කර ක්‍රියාත්මක කළ ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කිරීම ජූලි මස මැද දක්වා ප්‍රමාද විය. | මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගත හැකි ආකාරයෙන් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වියයුතු බව. |
| (ආ) | 2021 ක්‍රියාකාරී සැලැස්ම එහි ප්‍රගති වාර්තාව සමග සංසන්දනය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| | • ක්‍රියාකාරකම් 73 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර ප්‍රගති වාර්තාවේ ඇතුළත් ක්‍රියාකාරකම් 05 ක් 2021 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. | රටේ පවතින තත්ත්වය හේතුවෙන් 2021 ක්‍රියාකාරී සැලැස්ම තුල හඳුනා ගත් ඇතැම් ක්‍රියාකාරකම් නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුබව හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මකට නව ක්‍රියාකාරකම් ඇතුළත් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| • ආයෝජන මණ්ඩලයට අයත් නොවන අරමුදල්වලින් (ඇතැම් අමාත්‍යාංශවලින්) සිදු කර තිබෙන ක්‍රියාකාරකම් 04 ක්, එවැනි ක්‍රියාකාරකම් බාහිර පාර්ශවයන් විසින් සිදු කරනු ලැබ එවැනි ක්‍රියාකාරකම් අවසන් කර හෝ 2020 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක කර හෝ නොතිබුණද, 2021 ක්‍රියාකාරී සැලැස්මේ හා එහි ප්‍රගති වාර්තාවේ 2021 වර්ෂය සඳහා වූ අයවැය වෙන් කිරිම සමග එම ක්‍රියාකාරකම් හා එහි ප්‍රගතිය ඇතුළත් කර තිබුණු බව නිරික්ෂණය විය. | බාහිර පාර්ශවයන් විසින් බාහිර අරමුදල්වලින් සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් ආයෝජන මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට වැරදීමකින් ඇතුළත් වී ඇති අතර අනාගතයේදී මෙය නැවත සිදු වීම වැළැක්වීම සඳහා පියවර ගනු ඇත. | නිවැරදි තොරතුරු දැක්විය යුතු බව. |